# කාර්යසාධන වාර්තාව

# 2013

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

*නො. 42,*

*ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,*

*තැ.පෙ. 537,*

*කොළඹ - 07.*

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා
සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර
සංවර්ධනය "*

## මෙහෙවර

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය
හා
සියළු කෘෂිකාර්මික ඉඩම්වලින්
ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි
ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ
සේවාවන් සැකසීම හා කාලානුරූපව
පවත්වා ගෙන යාම"*

# හැඳින්වීම

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

## අරමුණු හා ප්‍රධාන කාර්යයන්

01. රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාල විධි විධාන සැලැස්වීම.
02. කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්/අඳ ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.
03. ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.
04. ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම සහ අධීක්ෂණය.
05. දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාලව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුලත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.
06. කෘෂිකාර්මික ඉඩම් වලට අදාල අඳගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.
07. සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාල වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.
08. ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.
09. රජයේ කෘෂිකාර්මික හා කාලීන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී වෙනත් ආයතන වෙත අවශ්‍යවන්නා වූ ආයතනික, නෛතික, සහායක හා කළමනාකරණ සේවාවන් සැලසීම.

# ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගෙන්.........

දූරාතීතයේ සිට ලාංකීය ගොවි ජනතාවගේ පාරම්පරික ඇවතුම් පැවතුම් හා බද්ධව යැපුම් ආර්ථිකයක්ව පැවති ශ්‍රී ලංකාවේ වී වගාව ඇතුළු කෘෂිකර්මාන්තය මේ වන විට සැළකිය යුතු දියුණු අවධියක පවතී. පෙරදිග ධාන්‍යාගාරය ලෙස පැරකුම් යුගයෙහි විරුදාවලිය ලත් අප කුඩා දිවයින එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් දියුණු වී මේ වන විට සහල් අපනයනය කිරීම දක්වා සාඩම්බර ගමනක අවතීර්ණ වී ඇත.

ඊසාන දිග හා නිරිත දිග මෝසම් වලින් ලැබෙන රන් වැසි දියෙන් අව් වැසි නොබලා යන්ත්‍ර සූත්‍ර හා කරට කර ලෙස තම කාය ශක්තියෙන් කෙත් වතු අස්වද්දන ගොවි මහතුන් ලාංකීය කෘෂිකර්මාන්තය ක්‍රියාත්මක කරන කොඳු නාරටිය වේ. ඔවුනගේ ක්‍රියා දාමය නිසි මාවතකට යොමු කරමින් නව කෘෂි තාක්ෂණයේ මහිමයෙන් ඉහල අස්වැන්නක් වෙත ඔවුන් රැගෙන යන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන්ගේ කාර්යභාරය මෙහිදී පැසසුම් කටයුතුය.

2013 වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ඉලක්කයන් වෙත පියනැගීමේ ක්‍රමවේදයන් මැනවින් විස්තර කර ඇති 2013 පාලන වාර්තාව මෙලෙසින් එලි දැක්වීමට ලැබීම සතුටට කරුණකි. එමෙන්ම, මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය උපදෙස් හා නායකත්වය නොඅඩුව ලබා දුන් ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය තුමන් ඇතුළු නියෝජ්‍ය අමාත්‍ය තුමන්ලා ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන්ම, 2013 පාලන වාර්තාව එලි දැක්වීමට නන් අයුරින් උපදෙස් හා සහය ලබා දුන් සියළු දෙනා හට මාගේ ස්තූතිය පුද කර සිටිමි.

එම්.ඒ.එස්.වීරසිංහ

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

# පටුන

පිටු අංකය


- ❖ පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය. **01**
- ❖ සංවර්ධන හා ප්‍රගති පාලන අංශය. **18**
- ❖ ඉංජිනේරු අංශය. **23**
- ❖ ආයතනික සංවර්ධන අංශය **24**
- ❖ ප්‍රවාහන අංශය. **28**
- ❖ නීති අංශය. **29**
- ❖ ගිණුම් අංශය. **32**
- ❖ අභ්‍යන්තර විගණන අංශය. **35**
- ❖ ඵලදා වර්ධන හා අලෙවි අංශය. **36**
- ❖ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය **38**
- ❖ ජල කළමනාකරණ අංශය. **42**

*ඇමුණුම්.*

- ඇමුණුම **01** **47**
- ඇමුණුම **02** **52**
- ඇමුණුම **03** **57**

# 01.පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය.

## 1.1 ආයතන අංශය.

### 1.1.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව.

දීපව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව මෙම දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව 15425කි. 2013 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 12418කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 3007කි. මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර නිලධාරින් 62 ක්ද සංවර්ධන සහකාර නිලධාරින් 116 ක්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබේ. මීට අමතරව 25 දෙනෙකු සහකාර අධ්‍යක්ෂවරු වශයෙන් සමාලෝචන වර්ෂය තුළදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් මත දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අනුයුක්ත කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03ක් ද නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 08ක් ද අනුමත වී ඇත. සමාලෝචන වර්ෂය අවසානය වන විට මින් නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 03ක් පුරප්පාඩුව පැවතුණි.දෙපාර්තමේන්තුව සඳහා සහකාර කොමසාරිස් තනතුරු 43ක් අනුමත වී ඇති අතර ඉන් තනතුරු 10ක් පුරප්පාඩුව පැවතුණි. 28ක් වූ අනුමත දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තනතුරු සංඛ්‍යාවෙන් සමාලෝචන වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 02කි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 26කි.

රාජ්‍ය කළමනාකරණ සහකාර අධි පන්තියේ පුරප්පාඩු 24ක් වූ අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 162ක් විය. සමාලෝචන වර්ෂය තුළදී රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට නවක නිලධාරීන් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුවට නිලධාරීන් 24ක් අනුයුක්ත කිරීම නිසා පුරප්පාඩු තරමක් සම්පූර්ණ කර ගැනීමට හැකි විය.

### 1.1.2 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානි ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනිම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට වග කියන අතරම, ඒ සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන්ට වගකිම් හා බලතල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහා සහය ලබා දුන් සමාලෝචන වර්ෂ අවසානය වන විට සේවයේ නිරත වි සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු ආශ්‍රිතව පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සේවක සංඛ්‍යා තොරතුරු 2013.12.31 දිනට**

| අනු අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | - |
| 2 | අතිරේක කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | - |
| 3 | කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ I | 3 | 3 | 3 |
| 4 | නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ | 43 | 33 | 10 |
| 5 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලං.ඉ.සේ | 1 | 1 | - |
| 6 | ඉංජිනේරු (යාන්ත්‍රික) | ශ්‍රී ලං.ඉ.සේ | 1 | - | 1 |
| 7 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ | 12 | 8 | 4 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ I | 1 | 1 | - |
| 9 | ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ | 13 | 7 | 6 |
| 10 | අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සම්.සේ | 1 | 1 | - |
| 12 | නීති නිලධාරි | දෙපාර්තමේන්තු | 1 | - | 1 |
| 13 | සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තු | 28 | 2 | 26 |
| 14 | ගොවිජන සංවර්ධන නිලධාරි (විශේෂ) | දෙපාර්තමේන්තු | 30 | - | 30 |
| 15 | ගොවිජන සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තු | 557 | 417 | 140 |
| 16 | රාජ්‍ය කළමනාකරණ සේවය අධි පන්තිය | රා.ක.ස.සේ. - අධි | 31 | 7 | 24 |
| 17 | භාෂා පරිවර්ථක සේවය | භාෂා පරිවර්තක සේවය | 2 | - | 2 |
| 18 | යාන්ත්‍රික අධිකාරි | දෙපාර්තමේන්තු | 2 | 2 | - |
| 19 | තාක්ෂණ නිලධාරි (විශේෂ) | ශ්‍රී.ලං.තා.සේ (විශේෂ) | 22 | 8 | 14 |
| 20 | කාර්මික නිලධාරි | ශ්‍රී.ලං.තා.සේ I<br>ශ්‍රී.ලං.තා.සේ II | 100 | 68 | 32 |
| 21 | කාර්මික නිලධාරි (යාන්ත්‍රික) | ශ්‍රී.ලං.තා.සේ | 5 | - | 5 |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලං.තොරතුරු තා.සේ. | 1 | - | 1 |
| 23 | අයවැය සහකාර | - | 1 | 1 | - |
| 24 | නීති සහකාර | දෙපාර්තමේන්තු | 25 | 14 | 11 |
| 25 | ගොවි බැංකු ව්‍යාපෘති සහකාර | දෙපාර්තමේන්තු | 100 | 55 | 45 |
| 26 | සංවර්ධන නිලධාරි සේවය | සංවර්ධන නිලධාරි සේවය (ස්ථිර කර ඇති)<br>සංවර්ධන නිලධාරි සේවය(ස්ථිර කර නොමැති) | 2500 | 1659<br>206 | 635 |
| 27 | සැළසුම් ශිල්පි | ශ්‍රී ලං.තා.සේ. | 1 | 1 | - |
| 28 | පුස්තකාලායාධිපති | පුස්තකාලායාධිපති සේවය | 1 | - | 1 |
| 29 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | රා.ක.ස.සේ | 538 | 376 | 162 |
| 30 | ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු | දෙපාර්තමේන්තු | 557 | 420 | 137 |
| 31 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | දෙපාර්තමේන්තු | 10400 | 8838 | 1562 |
| 32 | ක්ෂේත්‍ර සහකාර* | දෙපාර්තමේන්තු | 2 | 1 | 1 |

| අනු අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 33 | ලඝු/යතුරු ලේඛක* | දෙපාර්තමේන්තු | 15 | 11 | 4 |
| 34 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.තා.සේ. | 3 | - | 3 |
| 35 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111 | 79 | 32 |
| 36 | යන්ත්‍ර කාර්මික | දෙපාර්තමේන්තු | 8 | - | 8 |
| 37 | රිය සහයක | දෙපාර්තමේන්තු | 21 | 7 | 14 |
| 38 | මුරකරු | දෙපාර්තමේන්තු | 83 | 61 | 22 |
| 39 | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | 110 | 68 | 42 |
| 40 | සංචාරක බංගලා භාරකරු | දෙපාර්තමේන්තු | 7 | 3 | 4 |
| 41 | කම්කරු* | දෙපාර්තමේන්තු | 17 | 7 | 10 |
| 42 | යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 36 | 32 | 4 |
| 43 | යන්ත්‍ර ක්‍රියාකරු සහයක | දෙපාර්තමේන්තු | 32 | 21 | 11 |
| එකතුව | | | **15425** | **12418** | **3007** |

*යටපත් වී යන සේවාවන්ය.

**X** ශ්‍රී.ලං.පරි.සේ III පන්තියේ නිලධාරීන් 3ක් කොමසාරිස් තනතුරේ වැඩ බලනු ලැබේ.

## 1.1.3.ආයතන කටයුතු.

**(I) 2013 වර්ෂය තුළ දීප ව්‍යාප්ත සේවා වල නිලධාරීන්ගේ විචලතා පහත පරිදි වේ.**

- **2013 වර්ෂය තුළදී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලට අදාල තොරතුරු පහත පරිදි වේ.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | එච්.ඒ.චන්දන කුමාරසිංහ මයා ශ්‍රී.ලං.ප.සේ 1 | 2013.02.06 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 2 | පී.එස්.බණ්ඩාර මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.07.18 | කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 3 | එස්.එම්.එම්.විජිතා මායාදුන්නේ මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.02.06 | පොලිස් මූලස්ථානය සිවිල් පරිපාලන කාර්යාලය |
| 4 | හේමන්ත ගමගේ මයා ශ්‍රී.ලං.ප.සේ 1 | 2013.04.05 | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 5 | අයි.බී.ගුණවර්ධන මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.01.09 | මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 6 | සුමිත්‍රා කන්නන්ගර මිය ශ්‍රී.ලං.ප.සේ (විශේෂ) | 2013.06.20 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය |

➢ **දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබඳ විස්තර**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | බී.ඒ.එන්.දිල්රුක්ෂි මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.01.24 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය |
| 2 | ඩබ්.එම්.ටී.ඩී.වීරකෝන් මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.01.24 | මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය |
| 3 | ටී.ඒ.ගමගේ මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.02.06 | පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 4 | ආර්.යු.ඩබ්.ඩී.බී.කේ.ඇහැලේපොල මයා ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.01.04 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| 5 | එම්.ආර්.නිරෝෂා දීපනී මිය ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.02.28 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |

➢ **2013 වර්ෂයේ ශ්‍රී.ලං.ගණකාධිකාරී සේවයේ හා ඉංජිනේරු සේවයේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | එම්.ඒ.අයි.එස්.මහානාම මිය ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.05.03 | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 2 | ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මයා ශ්‍රී.ලං.ග.සේ 1 | 2013.07.17 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |

**(II) නව බඳවා ගැනීම්.**

සමාලෝචන වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවට නව පත්වීම් ලබා පැමිණි ශ්‍රී.ලං.ප.සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 1 | ආර්.නිශාන්තන් මයා | ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.12.02 |
| 2 | ආර්.විජයකුමාර් මයා | ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.12.02 |
| 3 | බී.තෙවරාදන් මයා | ශ්‍රී.ලං.ප.සේ 111 | 2013.12.02 |

- දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ගණකාධිකාරී සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | කේ.පී.ඒ.ද සිල්වා මිය<br>ශ්‍රී.ලං.ග.සේ 1 | 2013.06.26 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

- දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ඉංජිනේරු සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | ආර්.එම්.ජිනදාස මයා<br>ශ්‍රී.ලං.ඉ.සේ III | 2013.01.15 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නව පත්වීම්

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 1 | කේ.සුරේෂ් මයා | ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.10.07 |
| 2 | ජේ.එච්. දමයන්ති මෙය | ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.10.07 |
| 3 | කේ.ජී.එස්.මධුවන්ති මෙය | ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.10.07 |
| 4 | ඩබ්.ටී.ඩී.යූ. ද සිල්වා මෙය | ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.10.07 |
| 5 | ඒ.සිත්ති නකීබා මිය | ශ්‍රී.ලං.ග.සේ 111 | 2013.11.06 |

(III) **පත්වීම් ස්ථිර කිරීම.**

- සමාලෝචන වර්ෂය තුළ කෘ.ප.නි.ස නිලධාරීන්ගේ ප්‍රතිඵල ලේඛන විභාග දෙපාර්තමේන්තුව මගින් සනාථ කරවා ගෙන අදාල පත්වීම් ස්ථිර කිරීමට කටයුතු කරන ලදී.
- ගොවිජන සේවා මධ්‍යස්ථානවල කමිටුවෙන් වැටුප් ලබන ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සුදුසුකම් සපුරා ඇති 96 දෙනෙකු ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම යටතේ 42 දෙනෙකුට පත්වීම් ලබා දෙන ලදී.
- මෙම වර්ෂයේ දී ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලවලට මුරකරුවන් 07 ක් බඳවා ගන්නා ලදී.
- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ආ ශ්‍රේණියේ නිලධාරීන් 2 දෙනෙකු ද බඳවා ගෙන ඇත.

### (IV) තනතුර අතහැරයාම, ඉල්ලා අස්වීම,මියයාම් ,වැඩ තහනම් කිරීම.

සමාලෝචන වර්ෂය තුළ සිදුවූ වෙනස්කම් පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | සේවය හැර යාම | ඉල්ලා අස්වීම | මියයාම් | මුදාහැරීම | වැඩ තහනම් |
|---|---|---|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | _ | 01 | _ | 07 | _ |
| 2 | රියදුරු සේවය | _ | _ | _ | 01 | _ |
| 3 | කාර්යාල සේවක සේවය | 01 | - | - | 02 | _ |
| 4 | කෘ.ප.නි.ස | 02 | 01 | 06 | 12 | 04 |
| 5 | කම්ටු ලිපිකරු | 02 | 01 | _ | 05 | 01 |
| 6 | ගො.ස.නි | _ | _ | 01 | 03 | 08 |
| | | **05** | **03** | **07** | **30** | **13** |

### (V) ස්ථාන මාරුවීම්.

දීප ව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවා වල නිළධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | ස්ථාන මාරු වී ගිය සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 56 | 57 |
| 2 | රියදුරු සේවය | 04 | 04 |

### (VI) විශ්‍රාම ගැනීම්.

සමාලෝචන වර්ෂය තුළ විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | විශ්‍රාම ගිය සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | වි.වැ.**2.17** වගන්තියෙන් | වි.වැ.**2.12** වගන්තියෙන් |
| 1 | ශ්‍රී.ලං.ප.සේ | _ | _ |
| 2 | සහකාර කොමසාරිස් දෙපා. | 01 | - |
| 3 | රා.ක.ස.සේ | 13 | - |
| 4 | රියදුරු | 05 | _ |
| 5 | කා.කා.ස | 07 | - |

| | | | |
|---|---|---|---|
| 6 | කම්වු ලිපිකරු | 17 | 01 |
| 7 | කෘ.ප.නි.ස | 06 | - |
| 8 | කාර්මික නිලධාරි | 03 | - |
| 9 | ගොවිජන සංවර්ධන නිලධාරී | 10 | _ |
| 10 | ලඝු යතුරු | - | - |

## 1.1.4. විදේශ සංචාර හා පුහුණු.

සමාලෝචන වර්ෂය තුළදී විදේශ ශිෂ්‍යත්ව,සම්මේලන හා වැඩමුළු වලට සහභාගීවීම පහත පරිදි වේ.

A. 2013.06.30 සිට 2013.07.05 දින දක්වා ඉන්දියාවේ පැවැත් වු (**Focus Group Discussion on the project "Access to Water in SARC Countries"**) වැඩමුළුවට ඉංජිනේරු(ජල කළමනාකරණ), ද.දි. ප්‍රභාත් විතාරණ මයා සහභාගී වීම.

B. 2013.08.11 දින සිට 2013.08.18 දින දක්වා කොරියාවේ පැවැත් වු (**"Knowledge Sharing Program-2013-Capacity Building Workshop"**) වැඩමුළුවට අනුරාධපුර, නියෝජ්‍ය කොමසාරිස් ආර්.එම්.ජී.සේනාරත්න මයා සහභාගී වීම.

C. 2013.10.14 සිට 2013.11.03 දින දක්වා චිනයේ පැවැති කෘෂි කාර්මීකරණය පිළිබඳ සම්මන්ත්‍රණය **(Seminar on Agriculture Industrialization)** සඳහා සහභාගී වීම.

1. එන්.ජී.එම්.එස්.කුමාර මයා -සහකාර කොමසාරිස්,නුවරඑළිය
2. කේ.පී.ආර්.එච්.සිල්වා මයා -සහකාර කොමසාරිස්,බදුල්ල
3. ඒ.එම්.ජී.සී.ඒ.මැණිකේ මෙය -සහකාර කොමසාරිස්,පුත්තලම

D. 2013.11.04. සිට 2013.11.09 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර ආසියානු තාක්ෂණ ආයතනයේ පැවැති (**Overseas Technical Training Programme on Watershed Management**) වැඩමුළුවට පහත නම් සඳහන් නිලධාරීන් සහභාගී වීම.

1. වී.අමරආරච්චි මයා -ප්‍රාදේශීය ඉංජිනේරු,අනුරාධපුර
2. එම්.පී.ශාන්ත ද සිල්වා -දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරි,කිළිනොච්චිය/වව්නියාව
3. වී.නිරංජන් මයා -තාක්ෂණ නිලධාරි,මුලතිව්
4. වී.ශ්‍රි රංගන් මයා -තාක්ෂණ නිලධාරි,කිළිනොච්චිය

## 1.1.5. විනය කටයුතු.

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විධිමත් විනය පරික්ෂණ ආරම්භ කර ඇති සංඛ්‍යාව 80කි. චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇති විනය පරීක්ෂණ ගණන 40කි. විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කිරීමට ඇති ප්‍රමාණය 04කි. සමාලෝචන වර්ෂය තුළදී විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කර ඇති ප්‍රමාණය 46කි.

## 1.1.6. පුහුණු හා හැකියාවර්ධන

සමාලෝචන වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කුසලතා, ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ. මේ සඳහා රු.40,000,00.00 ක් වෙන් වී තිබූ අතර වර්ෂය අවසාන වන විට රු.29,074,48.00ක් වැය කර තිබුණි.

| අනු අංකය | පුහුණු විෂය | පුහුණු කළ නිලධාරීන් | පැවැත් වූ කාලය | පැවැත් වූ දිනය | පැවැත් වූ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලයෙන් කළ පුහුණු වැඩසටහන් | | | | | | |
| 1 | දෙමළ භාෂා (උසස්) පාඨමාලාව හැදෑරීම | එම්.ජී.අයි.එස්.මහානාම මිය | මාස 06 | – | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | – |
| 2 | දෙමළ භාෂා (උසස්) පාඨමාලාව හැදෑරීම | කේ.ජී.එස්.සමරජීව මිය | මාස 06 | – | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | – |
| 3 | දෙමළ භාෂා (මූලික) පාඨමාලාව හැදෑරීම | එම්.එල්.එන්.සඳමාලි මිය | මාස 06 | – | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | – |
| 4 | දෙමළ භාෂා (මූලික) පාඨමාලාව හැදෑරීම | වයි.අයි.ඩී.ගුණවර්ධන මෙය | මාස 06 | – | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | – |
| 5 | දෙමළ භාෂා (මූලික) පාඨමාලාව හැදෑරීම | එම්.ට්.වීරසිංහ මෙය | මාස 06 | – | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | – |
| 6 | විගණන පුහුණු වැඩමුළුව | අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත නිලධාරීන් | දින 02 | 2013.02.07 හා 08 | පොතුහැර ගො.සං.ජා.පු.ආයතනය | 50 |
| 7 | ගබඩා කළමනාකරණය හා සැපයුම්ජාල කළමනාකරණය | ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික්කාර්යාල වල විෂය භාර රාජ්‍යකළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් | දින 02 | 2013.05.13 හා 14 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය | 50 |
| 8 | කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය | ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික්කාර්යාල වල විෂය භාර රාජ්‍යකළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් | දින 02 | 2013.07.04 හා 05 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 85 |
| 9 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගො.ස.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් | දින 03 | 2013.09.12, 13 හා14 | වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය | 45 |
| 10 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගො.ස.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් | දින 03 | 2013.10.10, 11 හා12 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 75 |
| 11 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | අම්පාර (සිංහල භාෂාවෙන් රාජකාරි කරන ) හා මාතලේ ගො.ස.නි. හා ගො.සේ.ම. ලිපිකරුවන් | දින 03 | 2013.11.14, 15 හා16 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 55 |
| 12 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | කෑගල්ල,නුවරඑළිය දිස්ත්‍රික්ක වල ගො.ස.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් / ගම්පහ - 05 | දින 03 | 2013.12.12, 13 හා14 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 80 |
| 13 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | යාපනය දිස්ත්‍රික්කයේ සං.නිලධාරීන් හා ගො.සං.නිලධාරීන් | දින 02 | 2013.12.12 හා 13 | යාපනය දිස්ත්‍රික් කාර්යාලය | 45 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | ගො.සේ.ම. ලිපිකරුවන්ගේ වැටුප් පරිවර්තනය | කොළඹ,ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක වල ගො.සේ.ම.ලිපිකරුවන් හා රා.කළ.සේ. නිලධාරීන් | දින 01 | 2013.12.21 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 70 |
| 15 | ගො.සේ.ම. ලිපිකරුවන්ගේ වැටුප් පරිවර්තනය | කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කවලගො.සේ.ම. ලිපිකරුවන්හා රා.කළ.සේ. නිලධාරීන් | දින 01 | 2013.12.23 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 65 |
| 16 | ගො.සේ.ම. ලිපිකරුවන්ගේ වැටුප් පරිවර්තනය | මාතලේ,මහනුවර හා රත්නපුර දිස්ත්‍රික්කවල ගො.සේ.ම. ලිපිකරුවන්හා රා.කළ.සේ. නිලධාරීන් | දින 01 | 2013.12.26 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 65 |
| 17 | ගො.සේ.ම. ලිපිකරුවන්ගේ වැටුප් පරිවර්තනය | ගාල්ල,මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල ගො.සේ.ම. ලිපිකරුවන් හා රා.කළ.සේ. නිලධාරීන් | දින 01 | 2013.12.28 | වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය | 70 |
| 18 | දෙමළ භාෂා (උසස්) පාඨමාලාව හැදෑරීම | එම්.එල්.එන්.සඳමාලි මිය | – | – | – | – |
| 19 | දෙමළ භාෂා (උසස්) පාඨමාලාව හැදෑරීම | වයි.අයි.ඩී.ගුණවර්ධන මෙය | – | – | – | – |
| 20 | දෙමළ භාෂා (උසස්) පාඨමාලාව හැදෑරීම | එම්.ඊ.වීරසිංහ මෙය | – | – | – | – |
| 21 | කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සමාජ විද්‍යාව)හැදෑරීම | ආර්.එම්.ජී.සේනාරත්න මයා | – | – | කැළණිය විශ්ව විද්‍යාලය | – |
| 22 | 2000 අංක 46 දරණ පනතට අදාල නියෝග සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / ස.කොමසාරිස් වරුන් | දින 02 | 2013.11.25 හා 26 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 20 |
| 23 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාඨමාලා සඳහා සහභාගී වීම වෙනුවෙන් සහභාගීත්ව දීමනා ලබා දීම | රාජ්‍ය කළමනාකරණ සේවයේ හා සංවර්ධන නිළධාරී සේවයේ නිලධාරීන් | – | – | – | – |
| 24 | 2012 වර්ෂයේ බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | යාපනය දිස්ත්‍රික්කයේ උපාධිධාරී අභ්‍යාසලාභීන් | දින 02 | – | යාපනය දිස්ත්‍රික් කාර්යාලය | 70 |
| 25 | අධිකරණ කටයුතු පිළිබඳ ගො.ස.නි.ඇනුවත් කිරීමේ එක් දින පුහුණු වැඩමුළුව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් | දින 01 | 2013.06.08 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | – |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | 2014 දැයට කිරුළ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන (කලාප 03) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් ,සං.නි හා කෘ.ප.නි.ස.නිලධාරීන් | දින 01 | 2013.06.18, 20,හා 21 | 1.කුලියාපිටිය නගර ශාලාව(431) 2.විජයබා පාසැල් ශ්‍රවනාගාරය (531) 3.කුරුණෑගල නගර සභා ශාලාව (699) | 1660 |
| 27 | 2014 දැයට කිරුළ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන (කලාප 02) | කෑගල්ල දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් ,සං.නි හා කෘ.ප.නි.ස.නිලධාරීන් | දින 01 | 2013.06.27 | 1.ආචාර්ය එන්.එම්.පෙරේරා අනුස්මරණ ශාලාව (280) 2.කෑගල්ල නගර සභා ශාලාව (234) | 514 |
| 28 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | කෑගල්ල දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් | දින 02 | 2013.09.05 හා 06 | කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | 25 |
| 29 | නඩු කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු වැඩමුළුව | මහනුවර දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් | දින 01 | _ | මහනුවර දිස්ත්‍රික් කාර්යාලය | 50 |
| 30 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම | ප්‍රගති සමාලෝචන සහකාර ආර්.එච්.ලක්ජය මහතා | _ | _ | _ | _ |
| 31 | කොළඹ විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම | ආර්.පී.නිල්මිණි ජයසිංහ මිය | _ | _ | _ | _ |
| 32 | ගොවිජන බැංකු ගිණුම්කරණ පුහුණු වැඩමුළුව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු 22 ක සංවර්ධන නිලධාරීන් ,ගොවිජන බැංකු කෘ.ප.නි.ස.වරුන් | දින 02 | 2013.11.04 හා 05 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 50 |
| 33 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | ගම්පහ දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් | දින 03 | 2013.11.18 හා 19 | ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය | 40 |
| 34 | විගණන පුහුණු වැඩමුළුව | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගො. සං.නිලධාරීන් | දින 01 | 2013.10.31 | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය | 30 |
| 35 | දෙපාර්තමේන්තු කාර්යභාර්ය හදුන්වාදීමේ පුහුණු වැඩසටහන | රත්නපුර දිස්ත්‍රික්කයට අනුයුක්ත සං.නිලධාරීන් | දින 02 | 2013.12.02 හා 03 | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය | 125 |
| 36 | දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ නිලධාරීන් විෂයගත කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | මහනුවර දිස්ත්‍රික්කයේ මාධ්‍ය ඒකකයේ නිලධාරීන් | දින 01 | 2013.12.06 | ඒදඬුවාව ගොවිජන සේවා පුහුණු මධ්‍යස්ථානය | 116 |
| 37 | බීජ නිෂ්පාදන පුහුණු වැඩමුළුව | ගොවි මහතුන් | දින 01 | _ | _ | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 38 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | යාපනය දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නි. හා සං.නිලධාරීන් | දින 02 | 2013.12.12 හා 13 | යාපනය දිස්ත්‍රික් කාර්යාලය | 50 |
| 39 | දිවිනැගුම වැඩසටහන පිළිබඳ කෘ.ප.නි.ස වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | ගම්පහ දිස්ත්‍රික්කයට අනුයුක්ත උපාධිධාරී අභ්‍යාසලාභීන් | දින 03 | 2013.12.09 සිට 24 දින දක්වා | ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථානවල දී | 710 |
| 40 | දෙපාර්තමේන්තු කාර්යභාර්ය හඳුන්වා දීමේ පුහුණු වැඩසටහන | කුරුණෑගල දිස්ත්‍රික්කයට අනුයුක්ත උපාධිධාරී අභ්‍යාසලාභීන් | දින 03 | 2012.12.10, 11හා 12 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 226 |
| 41 | ගොවිජන බැංකු පුහුණු වැඩසටහන | කොළඹ දිස්ත්‍රික්කයට අනුයුක්ත ගොවිජන බැංකු කෘ.ප.නි.ස.වරුන් | දින 01 | 2013.12.19 | මහරගම ගොවිජන සේවා මධ්‍යස්ථානය | 9 |
| 42 | දෙපාර්තමේන්තු කාර්යභාර්ය හඳුන්වා දීමේ පුහුණු වැඩසටහන | මහනුවර දිස්ත්‍රික්කයට අනුයුක්ත සං.නිලධාරීන් | දින 04 | 2013.12.05, 10,17හා 24 | ඒදඬුවාව ගොවිජන සේවා පුහුණු මධ්‍යස්ථානය | 50 |
| 43 | නඩු කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු වැඩමුළුව ( 2 වන අදියර ) | මහනුවර දිස්ත්‍රික්කයට අනුයුක්ත සං.නිලධාරීන් | දින 01 | 2013.12.27 | මහනුවර දිස්ත්‍රික් කාර්යාලය | 55 |
| 44 | ජල කළමනාකරණ පුහුණුව | කාර්මික නිලධාරීන් හා ඉංජිනේරු වරුන් | – | – | – | 30 |
| 45 | කාබනික පොහොර භාවිතය පිළිබඳ පුහුණුව | දිස්ත්‍රික්ක 13 ක පස් පරීක්ෂණාගාර සඳහා පුහුණුව ලත් නිලධාරීන් | – | – | – | 30 |

## 1.1.7. සාකච්ඡා.

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත් වූ සාකච්ඡා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | සාකච්ඡා වර්ගය | සහභාගී වූවන් | පැවැත් වූ දිනය | පැවැත් වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.02.14 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 120 |
| 2 | ගො.සං.දෙ.ඉදිරි වැඩ සැළැස්ම හා ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.02.26 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | 100 |
| 3 | ගො.සං.දෙ.ඉදිරි වැඩ සැළැස්ම හා ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳ වැඩමුළුව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගො.සං.නි., ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්, නීති සහකාර, ගොවි බැංකු ව්‍යාපෘති සහකාර, කෘෂි.නි.ව්‍යා.සහකාර, සංවර්ධන සහකාර, | 2013.03.09 | මහරගම යූත් ප්‍රධාන ශාලාව | 1515 |
| 4 | නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.05.06 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 65 |
| 5 | 2014 දැයට කිරුළ ජංගම සේවාව පිළිබඳ සාකච්ඡාව | හලාවත දිස්ත්‍රික්කයේ ගො.සං.නි.,සං.සහකාර හා උපාධිධාරී අභ්‍යාසලාභීන් | 2013.06.13 | හලාවත පුදසුන ශාලාව | 389 |
| 6 | නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.07.26 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 115 |
| 7 | නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.10.07 හා 08 | පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 105 |
| 8 | 2014 අයවැය යෝජනා පිළිබඳ දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සං.කො.වරුන් දැනුවත් කිරීමේ සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.12.09 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 95 |
| 9 | 2013 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම පිළිබඳ සාකච්ඡාව | දිස්ත්‍රික් භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ විෂය භාර නිලධාරීන් | 2013.12.13 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 60 |
| 10 | ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන නිලධාරීන් | 2013.01.18 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම | මාණ්ඩලික නිලධාරීන් හා විෂය ලිපිකරුවන් | 2013.01.21 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 35 |
| 12 | ස.කො (දෙපා.)තනතුරේ පුරප්පාඩු පිරවීම සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳ වූ සාකච්ඡාව | මාණ්ඩලික නිලධාරීන්,ගො.සං.නි (1 ශ්‍රේණිය) | 2013.01.18 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 50 |
| 13 | ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන නිලධාරීන් | 2013.02.15 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 45 |
| 14 | ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන නිලධාරීන් | 2013.05.10 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 45 |
| 15 | ශ්‍රී ලංකා ගොවිජන සංවර්ධන ව්‍යාපෘතිය(SLASDP) සැකසීම පිළිබඳ වූ සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් | 2013.06.14 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 30 |
| 16 | ගො.සං.දෙ.ප්‍රතිසංවිධානය කිරීමේ සාකච්ඡාව | අමාත්‍යංශ නිලධාරීන්,දිස්ත්‍රික්ක 05ක නි/ස.කො.වරුන්,ගො.සං.නි.,ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2013.07.08 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 185 |
| 17 | විගණන කළමනාකරණ කමිටු රැස්වීම | ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් හා විෂය භාර නිලධාරීන් | 2013.08.26 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 25 |
| 18 | 2014 දැයට කිරුළ වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | කෑගල්ල,පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික් නි/ස.කො.වරුන්,ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් හා විෂය ලිපිකරුවන් | 2013.09.05 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 15 |
| 19 | ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන නිලධාරීන් | 2013.09.16 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 40 |
| 20 | මාතර දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලය සමග පැවැත්වෙන සාකච්ඡාව | මාතර දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩල නියෝජිතයින් | 2013.10.09 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 20 |
| 21 | ගොවි බැංකු කටයුතු සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දීමේ වැඩසටහන | ගොවි බැංකු රාජකාරි වල නියුතු නිලධාරීන් | 2013.11.11 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 130 |
| 22 | ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන නිලධාරීන් | 2013.11.25 | ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය | 65 |

**1.1.8.** සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන් වල නිලධාරීන් පහත දක්වා ඇත.

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | අනුයුක්ත කාර්යාලය | තනතුර |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | | | | |
| 01 | එම්.ඒ.එස්.වීරසිංහ මයා | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් ජනරාල් |
| 02 | සුමිත්‍රා කන්නන්ගර මිය | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර.කාර්යාලය | අතිරේක කොමසාරිස් ජනරාල් |
| 03 | ටී.ඒ.ගමගේ මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් (මා.ස.සං) |
| 04 | එස්.ඩී.කේ.ප්‍රනාන්දු මයා | ශ්‍රී.ලං.ප.සේ. I | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් (සේවා) |
| 05 | හේමන්ත ගමගේ මයා | ශ්‍රී.ලං.ප.සේ. I | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් (සංවර්ධන) |
| 06 | කේ.ඒ.එස්.සමරජීව මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (පාලන) |
| 07 | එම්.ඊ.වීරසිංහ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (සේවා) |
| 08 | වයි.අයි.ඩී.ගුණවර්ධන මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (සංවර්ධන) |
| 09 | එම්.එල්.එන්.සඳමාලි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (ආයතන) |
| 10 | නිරෝෂා දීපනි ඊශ්වර මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | නි. කොමසාරිස් (සේවා) වැ.බ. |
| 11 | එන්.සිවලිංගම් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | මඩකළපුව | ස.කොමසාරිස් |
| 12 | බී.එන්.ඩී.කුමාර මයා | ශ්‍රී.ලං.ප.සේ. III | අම්පාර | ස.කොමසාරිස් |
| 13 | එම්.පී.ඩීරංජන් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | යාපනය | නියෝජ්‍ය කොමසාරිස් |
| 14 | ඩී.එම්.ජී.බී.දිසානායක මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කුරුණෑගල | ස.කොමසාරිස් |
| 15 | කේ.පී.ආර්.එච්.සිල්වා මයා | ශ්‍රී.ලං.ප.සේ. III | බදුල්ල | ස.කොමසාරිස් |
| 16 | එන්.පී.ගමගේ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | හම්බන්තොට | ස.කොමසාරිස් |
| 17 | ඩබ්.එම්.ටී.ඩී.කේ.වීරකෝන් මිය | ශ්‍රී.ලං.ප.සේ. III | මහනුවර | නියෝජ්‍ය කොමසාරිස් |
| 18 | ඩබ්.එම්.ඩී.කේ.වික්‍රමසිංහ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | මහනුවර | ස.කොමසාරිස් |
| 19 | ඊ.තයාරුපන් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කිළිනොච්චිය | ස.කොමසාරිස් |
| 20 | එස්.පුනිත කුමාර් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | ත්‍රිකුණාමළය | ස.කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| 21 | බී.එම්.සී.එච්.කුමාරිහාමි මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | පොළොන්නරුව | ස.කොමසාරිස් |
| 22 | බී.ඒ.එන්.දිල්රුක්ෂි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | කළුතර | ස.කොමසාරිස් |
| 23 | පී.ඒ.මධුසංඛ මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කොළඹ | ස.කොමසාරිස් |
| 24 | ආර්.එම්.ජී.සේනාරත්න මයා | ශ්‍රී.ලං.ප.සේ. III | අනුරාධපුරය | නි.කොමසාරිස් |
| 25 | එම්.සී.මලවිආරච්චි මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | අනුරාධපුරය | ස.කොමසාරිස් |
| 26 | ඉසඩ්.ඒ.එම්.ෆයිසාල් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කෑගල්ල | ස.කොමසාරිස් |
| 27 | ජේ.ඩී.එන්.එස්.ජයකොඩි මයා | ශ්‍රී.ලං.ප.සේ. III | රත්නපුරය | ස.කොමසාරිස් |
| 28 | පී.ජී.සෝමරත්න මයා | ශ්‍රී.ලං.ප.සේ. III | මාතලේ | ස.කොමසාරිස් |
| 29 | කේ.සුලෝජනී මිය | ශ්‍රී.ලං.ප.සේ. III | වව්නියාව | ස.කොමසාරිස් |
| 30 | පී.එස්.බණ්ඩාර මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ගම්පහ | ස.කොමසාරිස් |
| 31 | ආර්.එම්.ජී.සී.ඒ.මැණිකේ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | පුත්තලම | ස.කොමසාරිස් |
| 32 | එන්.ජී.එම්.එස්.කුමාර මයා | ශ්‍රී.ලං.ප.සේ. III | නුවරඑළිය | ස.කොමසාරිස් |
| 33 | ජී.ඩී.ඒ.ස්වර්ණලතා මිය | ශ්‍රී.ලං.ප.සේ. II | කුරුණෑගල | නි.කොමසාරිස් |
| 34 | ඊ.වී.ඩී.බී.කේ.බී.ඇහැලේපොල මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කුරුණෑගල | ස.කොමසාරිස් |
| 35 | ඩී.එච්.ඩී.ශ්‍යාමලි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | මාතර | ස.කොමසාරිස් |
| 36 | රවි ප්‍රසාද් කළුපහන මයා | ශ්‍රී.ලං.ප.සේ. III | ගාල්ල | ස.කොමසාරිස් |

**ගණකාධිකාරී සේවය**

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | අනුයුක්ත කාර්යාලය | තනතුර |
|---|---|---|---|---|
| 37 | කේ.ඒ.පී.ද සිල්වා මිය | ශ්‍රී.ලං.ග.සේ. I | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන ගණකාධිකාරී |
| 38 | රේණුකා කොළඹගේ මිය | ශ්‍රී.ලං.ග.සේ. II | ප්‍රධාන කාර්යාලය | අභ්‍යන්තර විගණක |
| 39 | ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මයා | ශ්‍රී.ලං.ග.සේ 1 | ප්‍රධාන කාර්යාලය | කොමසාරිස් (මුදල්) |
| 40 | එම්.ඒ.අයි.එස්.මහානාම මිය | ශ්‍රී.ලං.ග.සේ III | ප්‍රධාන කාර්යාලය | සහකාර කොමසාරිස් (සැපයීම්) |
| 41 | එම්.පී.කේ.ජයතුංග මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරී(ගෙවීම් හා සාරංශ) |
| 42 | ටී.ඒ.ඩබ්.නාරායන මිය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරී (ර.නි.අ) |

| | | | | |
|---|---|---|---|---|
| 43 | ජේ.එච්.දමයන්ති මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි (ප්‍රසම්පාදන හා ගිණුම්) |
| 44 | කේ.ජී.එස්.මධුවන්ති මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි (වැටුප් හා අත්තිකාරම්) |
| 45 | ඩබ්.ටී.ඩී.යු. ද සිල්වා මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි (ගොවි බැංකු) |
| 46 | කේ.සුරේෂ් කුමාර මයා | ශ්‍රී.ලං.ග.සේ. III | උතුරු පළාත | ගණකාධිකාරි |
| 47 | ඒ.සිත්ති නකීබා මිය | ශ්‍රී.ලං.ග.සේ. III | නැඟෙනහිර පළාත | ගණකාධිකාරි |

**ඉංජිනේරු සේවය**

| | | | | |
|---|---|---|---|---|
| 48 | ටී.එස්.විජේවර්ධන මයා | ශ්‍රී.ලං.ඉ.සේ. I | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු |
| 49 | ද.දි. ප්‍රභාත් විතාරණ මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | ප්‍රධාන කාර්යාලය | ඉංජිනේරු(ජල කළමනාකරණ) |
| 50 | ආර්.එම්.යු.රත්නායක මයා | ශ්‍රී.ලං.ඉ.සේ. I | කුරුණෑගල | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 51 | කේ.එම්.බී.කැඳරගම මයා | ශ්‍රී.ලං.ඉ.සේ. I | මහනුවර | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 52 | එච්.ජී.කේ.ප්‍රියශාන්ත මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | හම්බන්තොට | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 53 | අයි.එම්.මුනාස් මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | අම්පාර | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 54 | රියාසත් අලි මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | මඩකළපුව | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 55 | වසන්ත අමරආරච්චි මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | වව්නියාව | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 56 | බී.එම්.ආර්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | ශ්‍රී.ලං.ඉ.සේ. III | රත්නපුරය | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 57 | එම්.ජිනදාස මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | බදුල්ල | ප්‍රාදේශීය ඉංජිනේරු |

## 1.1.9. දෙපාර්තමේන්තු ගත සහකාර කොමසාරිස්වරුන් පිළිබඳ විස්තර.

| අනු අංකය | නිලධාරියාගේ නම | අනුයුක්ත කාර්යාලය |
|---|---|---|
| 01 | ඩබ්.ඒ.අයි.පෙරේරා මිය | කුරුණෑගල |
| 02 | එස්.ඒ.ඩබ්.සමරසිංහ මයා | මහනුවර |
| 03 | ඩබ්.එම්.එම්.පහළගිරිබාව මයා | අනුරාධපුරය |

# 1.2 පාලන අංශය.

පාලන අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා චෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශ වලින් ලැබෙන සියලුම ලිපි අදාල ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන්ද පාලන අංශය මගින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාල කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරී.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකථන පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- දුම්රිය බලපත්‍ර ලබා දීම.
- ප්‍රධාන කාර්යාලීය ඍජු දුරකථන පද්ධතිය නඩත්තු කිරීම.
- ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම.

# 02. සංවර්ධන හා ප්‍රගති පාලන අංශය.

## 2.1 පුරන් කුඹුරු අස්වැද්දීම.(වැය ශීර්ෂය- 281-2-2-10-2502)

පුරන් කුඹුරු අස්වැද්දීම වැඩසටහන යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා සංවර්ධන හා ප්‍රගති පාලන අංශය යටතේ වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 163.0 කි. එමගින් දිස්ත්‍රික්ක 23 ක් ආවරණය වන පරිදි සිදු කරන ලද නව ව්‍යාපෘති සංඛ්‍යාව 121 කි. මේ යටතේ අලුතින් වගා කෙරුණ අක්කර ප්‍රමාණය 3020 ක් වන අතර මෙතෙක් වගා කළ අක්කර 2521 ක් සඳහා ජල සම්පාදනය කිරීමද සිදුවිය. තවද 2013 වසරේ අලුතින් එකතු වූ ප්‍රතිලාභී ගොවි පවුල් ගණන 5083 ක් වන අතර වියදම රු.මි. 181.59 ක් විය.
2013 වසරේ වෙන් වූ රු.මි. 200 ක සමස්ථ ප්‍රතිපාදනයෙන් ඉතිරි රු.මි. 37 ජල කළමණාකරණ අංශය විසින් පාලනය කරන ලදී.

## 2.2 ගොඩනැගිලි පුනරුත්ථාපනය (ගොවිජන සේවා මධ්‍යස්ථාන).
**(වැය ශීර්ෂය - 281-2-2-0-2001)**

ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්ථාපනය සඳහා රු.මි. 80 ක් වෙන් කර තිබූ අතර මේ යටතේ රු.මි.78.29 ක වියදමක් දරා 97.87% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. ඒ අනුව දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි අවිච්ඡේද කර්මාන්ත 40 ක් සහ නව කර්මාන්ත 50 ක් පුනරුත්ථාපනය කරන ලදී.

## 2.3 ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන්.
**(වැය ශීර්ෂය - 281-1-1-0-2001)**

ඉහත වැය ශීර්ෂය යටතේ වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදන රු.මි. 30 ක් වන අතර වියදම රු.මි.27.42 කි. වියදමේ ප්‍රතිශතය 91.4% කි. මේ යටතේ දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන පරිදි අවිච්ඡේද කර්මාන්ත 07 ක් සහ නව කර්මාන්ත 64 ක් අලුත්වැඩියා කරන ලදී.

## 2.4 ගොඩනැගිලි ඉදිකිරීම්. (වැය ශීර්ෂය 281 -2-2-0-2104)

මේ සඳහා රු.මි. 60 ක් වෙන්කර තිබූ අතර දිස්ත්‍රික්ක 10 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 14 ක ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. මේ සඳහා රු.මි. 31.26 ක වියදමක් දරා 52.1% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

## 2.5 පොහොර ගබඩා ඉදිකිරීම. (වැය ශීර්ෂය 281-2-2-8-2104)

පොහොර ගබඩා ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 14 ක ප්‍රතිපාදන වෙන් වූ අතර දිස්ත්‍රික්ක 08 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 10 ක් වෙනුවෙන් රු.මි 10 ක වියදම් දරා ඇති අතර වියදමේ ප්‍රතිශතය 71.44% කි.

## 2.6 ගොඩනැගිලි නඩත්තු (දිස්ත්‍රික් කාර්යාල). (වැය ශීර්ෂය 281-1-1-0-1303)

ඉහත වැය ශීර්ෂය යටතේ ගොඩනැගිලි නඩත්තු කිරීම (දි.කා) සඳහා වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදන රු.මි. 1.5 ක් වන අතර ඒ සඳහා වියදම රු.මි. 1.1 කි. මේ යටතේ කර්මාන්ත 17 ක නඩත්තු කටයුතු සිදු කරන ලද අතර 71.7% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත

## 2.7 සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය.

මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. 2000 වසරේ සිදු කළ ග්‍රාමීය වාරිමාර්ග සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව පුරා වැව් 11257 ක් ද අමුණු 12942 ක් ද ඇත. මෙයට සම්බන්ධ වාරිමාර්ග ප්‍රමාණය අති විශාලය. වී වගා කරන ගොවීන් වෙනුවෙන් මේවා නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පසුගිය වර්ෂ 50 ක කාලය තුළ ඉටුකරන ලදී.

## 2.8 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන ලබා දීම.

මේ යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.මි. 25.37 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර එයින් වසර තුළදී රු.මි. 23.66 ක වියදමක් දරා ඇත. මේ මගින් ගම නැගුම වැඩසටහන යටතේ කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්ක වල සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු සිදු කරන ලදි.

## 2.9 ගොවීන්ගේ භාරකාර අරමුදල.

කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ දිස්ත්‍රික්ක 03 ක් සඳහා කෘෂිමාර්ග 19 ක් ප්‍රතිසංස්කරණය වෙනුවෙන් රු.මි. 18.5 ක මුදලක් ලබා දුන් අතර එහි වියදම රු.මි. 18.5 කි. ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ සුළුවාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දිස්ත්‍රික්ක 09 ක් වෙනුවෙන් කර්මාන්ත 92 සඳහා රු.මි.74 .76 ක් ලබා දී ඇත. භෞතික ප්‍රගතිය 98% කි.

ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ පොහොර ගබඩා ඉදිකිරීම සඳහා දිස්ත්‍රික්ක 09 ක් වෙනුවෙන් පොහොර ගබඩා 11 ක් සඳහා රු.මි. 19.5 ක මුදලක් ලබා දී ඇති අතර වසර අවසාන වන විට රු.මි.10.3 ක වියදමක් දරා ඇත. තවද මාතර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල ගො.සේ.ම වල අලුත්වැඩියා කටයුතු ද භාරකාර අරමුදල යටතේ සිදුකර ඇත.

## 2.10 ගොවිජන සංවර්ධන අරමුදල.

ගොවිජන සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික්ක 07 ක ව්‍යාපෘති 09 ක් සඳහා රු.මි. 4.1 ක මුදලක් ලබා දී ඇත.

## 2.11 අලුත් සහල් මංගල්‍යය. (2013 අප්‍රේල් 06 – 07)

අතීතයේ සිටම ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රධාන ජීවන මාර්ගය වූයේ කෘෂිකර්මාන්තය මුල් කරගත් වී ගොවිතැනය. වාරි සංස්කෘතිය තුළින් හා වැසි ජලයෙන් උපරිම ප්‍රයෝජනය ගනිමින් අපට උරුම කන්න වලට යමින් කලට වේලාවට ගොවිතැන් කරමින් මාස් කන්නයේ ලබාගන්නා වී අස්වනු වලින් අග්‍ර ඵලය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කිරීම ගොවිජනතාව එදා සිටම කරගෙන ආ උතුම් කාර්යයකි.

මෙම උතුම් කාර්යය “අළුත් සහල් මංගල්‍යය” නමින් තවදුරටත් ඔප් නංවමින් ජාතික උත්සවයක් ලෙස රජයේ පූර්ණ අනුග්‍රහය ලබමින් වාර්ෂිකව පවත්වා ගෙන යාමේ වගකීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ලැබූ මහඟු වරප්‍රසාදයක් බව පවසනුයේ ඉමහත් ආඩම්බරයෙනි . ඒ අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 අප්‍රේල් මස 6 සහ 7 වන දිනයන්හි අළුත් සහල් මංගල්‍යය 46 වන වරටත් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වන ශ්‍රීමහාබෝධීන් වහන්සේගේ අභියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.

සතර වාහල්කඩ කිරි ඉතිරිවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු සජීවීව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කිරීම පෙර වර්ෂවලදී මෙන් මෙවරද සිදුවිය. මී පැණි පූජාව හා ගිතෙල් පූජාව ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තෝ ප්‍රමුඛ ආදිවාසී කණ්ඩායම විසින් පවත්වන ලදී. දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක්රැස් කර භාරදුන් සහල් මෙදින පූජා කරණ ලද අතර සහල් හා මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් කරන ලදී. මෙවර අලුත් සහල් මංගල්‍ය සාර්ථක කරගැනීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල, උතුරු මැද පළාත් සභාව හා පෞද්ගලික ආයතනත් විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහිදී “ජාතික අලුත් සහල් මංගල්‍යය” නමින් සමරු කලාපයක්ද එළිදක්වන ලදී.

## 2.12 දැයට කිරුළ - 2013

2013 වසර සඳහා දැයට කිරුළ වැඩසටහන මෙවර ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් අම්පාර දිස්ත්‍රික්කයේ හාඩි කාර්මික විද්‍යාල භූමියේදී පවත්වන ලදී. මෙම වැඩසටහන වෙනුවෙන් මෙවර භාණ්ඩාගාරය වෙතින් රු. 25,000,000.00 ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ අතර ඒ යටතේ ආදර්ශ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම, ගෙවතු ඉදිකිරීම , වැවක් අලුත්වැඩියා කිරීම හා දැයට කිරුළ තොරණ ඉදිකිරීම ඇතුළු තවත් වැඩසටහන් කීපයක්ම ඇතුළත් වී තිබූ අතර, ඒ සඳහා වූ වියදම රු.3801671.00 කි. තව ද, මෙම ප්‍රතිපාදන යටතේම කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම දිස්ත්‍රික්කවල ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව සඳහා ද රු.19,000,000.00 ක් වැය කරණ ලදි. ඊට අමතරව 2013 වසරේ අනුරාධපුර පවත්වන්නට යෙදුණු අලුත් සහල් මංගල්‍යය වෙනුවෙන් රු.2,178,379.43 ක් ද වියදම් දරා ඇත. මෙම වැඩසටහන් සඳහා වූ මුළු වියදම රු. 24,980,050.43 කි.

## 2.13 යාන්ත්‍රික සේවා සැපයීම.

### 2.13.1දෙපාර්තමේන්තුව සතු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර

සංවර්ධන හා ප්‍රගති පාලන අංශය සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය මේ වන විට යාන්ත්‍රික අධිකාරිවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දැනට අප දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර ප්‍රමාණය 58 කි. එයින් යන්ත්‍ර 20 ක් පහත දැක්වෙන වර්ෂ වලදී "ජපන් යෙන්" ප්‍රදානය යටතේ ලැබී ඇත. තවද, 2009 , 2011 වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍ර දෙකක් ද ලබාගෙන ඇත.

| වර්ෂය - | 1983 | 1984 | 1985 | 1986 | 1990 | 1994 | 1997 | 1999 | 2009 | 2011 | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍ර සංඛ්‍යාව- | 01 | 01 | 06 | 02 | 02 | 05 | 01 | 02 | 01 | 01 | = | 22 |

දැනට එක් ඩෝසර් යන්ත්‍රයක් ද, ට්‍රැක් ෂවල් යන්ත්‍රයක්ද අබලන් තත්වය මත සේවයෙන් ඉවත් කර අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර දැනට ඉතිරිව ඇති යන්ත්‍ර ප්‍රමාණය 20 කි.

මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් චීන යන්ත්‍රෝපකරණ 36 ක් ද 2011 වර්ෂය අවසානයේදී ලැබී ඇත.එම යන්ත්‍ර 2012 වර්ෂයේදී සේවයට එක් කරනු ලැබ ඇත.

### 2.13.2 2013 දී දෙපාර්තමේන්තු යන්ත්‍ර ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක

| | දිස්ත්‍රික්කය | යන්ත්‍ර ප්‍රමාණය |
|---|---|---|
| 01. | හම්බන්තොට | 12 |
| 02. | මොණරාගල | 06 |
| 03. | කුරුණෑගල | 13 |
| 04. | අනුරාධපුරය | 23 |
| 05. | වව්නියාව | 04 |
| | **එකතුව** | **58** |

2009, 2011 වර්ෂවලදී මිලට ගෙන ඇති පොන්ටූන් යන්ත්‍ර හැර අනිකුත් යන්ත්‍ර සියල්ලක්ම පාහේ දැනටමත් සේවා පැය 10,000 සීමාව පසු කර ඇති අතර, භාවිතා කළ වර්ෂ ගණනාව අනුවද **යන්ත්‍ර වල සම්පූර්ණ ආයු කාලය** ඉකුත්වී ඇති බව ඉහත අනුව පැහැදිලි වනු ඇත.

එනමුත් ඉතා දැඩි කැපවීමකින් යුතුව, මනා පරිශ්‍රමයකින් හා පාලනයකින් යුතුව නඩත්තු කර ඇති බැවින් මේවායින් **වැඩි ප්‍රමාණයක් තවමත් හොඳම යාන්ත්‍රික තත්වයෙන්** යුතුව තවදුරටත් නඩත්තු කරගෙන යාමට හැකිවී ඇත. යන්ත්‍ර නඩත්තුව සඳහා 2013 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය **රු.මිලි 18** කි. වියදම රු.මි.**7.72** කි. **(මෙවැනි යන්ත්‍රයක නව වටිනාකම රු.මිලියන 14-15 අතර ප්‍රමාණයක් වේ.)**

එම යන්ත්‍ර සහනදායී මිලකට ගොවි ජනතාව වෙත ලබා දීමට කටයුතු කරන අතර එම මිල යන්ත්‍ර සේවා පැයකට රු.500/= සිට රු.750/= ක් පමණ වේ. (සාමාන්‍යයෙන් මෙවැනි යන්ත්‍රයක් සේවා පැයකට අය කරනු ලබන වෙළඳ පොල වටිනානම රු.3000/= සිට රු.4000/= දක්වා වේ). එලෙස ගොවි ජනතාව වෙත සේවා සිදු නොකරන විටදී වෙනත් රජයේ කෘෂි / වාරි මාර්ග / සංවර්ධන වැඩසටහන් වලට ද යොදවනු ලබන අතර එවිටද රජයේ ගාස්තුවක් ලෙස අය කරනු ලබන්නේද රු.750/= ක (උපරිම) ගාස්තුවක් වේ.

ඉතා දුර බැහැර අති දුෂ්කර තත්වයන් යටතේ සේවා අවශ්‍යතාවය මත ගොවි ජනතාව වෙත උපරිම අයුරකින් සේවයේ යොදවනු ලබන මෙම යන්ත්‍ර මගින් 2013 වර්ෂයේ දී රජයට ලබා දී ඇති සහනදායී පදනම යටතේ උපයා ගත් ආදායම රු.2,885,503.00 කි. නොයෙක් මූල්‍ය හේතූන් හා ප්‍රතිපාදන ලැබී තිබුණ ද මුදල් ලැබීමට සිදුවූ ප්‍රමාදයන් නිසා අදාළ දිස්ත්‍රික්ක වලින් තව දුරටත් ආදායම් ලැබීමටත් ඇති බව පෙනී යයි.

ජනාධිපති කාර්ය සාධන බලකාය (උතුරු පළාත) මගින් වව්නියාව දකුණු ප්‍රදේශයේ සිදු කරන ලද සංවර්ධන කටයුතු හා වැව් පුනරුත්ථාපනය සඳහා දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර යොදවා ගන්නා ලද අතර එම යන්ත්‍ර මගින් සිදු කරන ලද කර්මාන්ත වල වටිනාකම රු.මි.09ක් පමණ විය. එම ක්ෂෙත්‍රයේදි විවිධ වු අපහසුතා මැද අතිදුෂ්කර තත්වයන් යටතේ සිදු කරන ලද මෙම සේවයට ජනාධිපති කාර්ය සාධක බලකායෙන් සිය ස්තුතිය ද පුද කර ඇත.

## 2.13.3 වව්නියාව දකුණ හා වැලිඔය ප්‍රදේශවල ජනාධිපති කාර්යය සාධක බලකාය විසින් සිදුකරන නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා අප දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර යොදවා සිදුකර ඇති දායකත්වය.

අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික් යන්ත්‍ර උපකරණ යොදවා විවිධ කර්මාන්ත වල ඉහත යටතේ කටයුතු කර ඇති අතර, ඒ අනුව ක්‍රියා කර ඇති මුළු යන්ත්‍ර සේවා පැය ගණන පැය 3000 ක් පමණ වේ.

මෙවැනි යන්ත්‍රයක සේවා පැයකින් ඉටුකරන කර්මාන්තයේ වෙළඳපොළ වටිනාකම රු.3500/= වඩා අධික වන අතර එසේ වුවත් එකී වටිනාකම ගණනය කළත්, අප යන්ත්‍ර මගින් මෙම ව්‍යාපෘතිය වෙත රු.මි.9.0ට වඩා වටිනා කාර්යය දායකත්වයක් ලබා දී ඇත.

වව්නියාව දකුණ අති දුෂ්කර ක්ෂේත්‍රවල ඉතා දැඩි කැපවීමකින් හා උනන්දුවෙන් යුතුව සිදුකරන ලද මෙකී සේවය ජනාධිපති කාර්යය සාධක බලකාය වෙතින් ඉතා ඉහලින් අගය කර ඇති අතර, ඒ පිළිබඳව ප්‍රශංසා හා කෘතඥතාවයද දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

මෙයට අමතරව දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම් අනුව විවිධ වූ හදිසි හා අත්‍යවශ්‍ය කර්මාන්තවල රජයේ ගාස්තුවෙන් තොරව අප දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර යොදවා කටයුතු කරවා දී ඇති අතර, හදිසි ආපදා තත්ව වලදී දෙපාර්තමේන්තු විෂයෙන් බැහැර වුවද යන්ත්‍රවලින් අදාළ සේවාවන් ලබා දී ඇත. උදාහරණයක් ලෙස, පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත නගරය ගංවතුරෙන් යටවීම වළකා ගැනීම සඳහා දැනට අවහිර වී ඇති නාගරික ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ කර්තව්‍යය නම් කළ හැකිය.

# 03. ඉංජිනේරු අංශය.

## 3.1 කාර්යයන්

- දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන සුළු වාරිමාර්ග, ගොඩනැගිලි, ගොවිජන සේවා මධ්‍යස්ථාන, දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම හා අලුත්වැඩියාවන් පිළිබඳ ඇස්තමේන්තු අනුගත කිරීම, ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ වාර්තා සකස් කිරීම සහ ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදු කිරීම.

- බාහිර ආයතන වලින් ඉදිරිපත් කරන පාරිසරික තාක්ෂණ ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ හා අදාල වාර්තා සැපයීම.

- යුධ ගැටුම් වලින් හානි වූ ප්‍රදේශ වල කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය (CAREP) යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම (ඇමුණුම 1) හා කෘෂිපාර සංවර්ධන කටයුතු සිදු කිරීම. (ඇමුණුම 2)

# 04.ආයතනික සංවර්ධන අංශය.

## අරමුණ හා වගකීම :

ගොවිජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරා දීම මගින් ඔවුන්ගේ ආර්ථිකමය හා සමාජයීය පසුබිම ශක්තිමත් කිරීම අරමුණුකොට මැදිහත්කරුවෙකුගේ භූමිකාව ඉටු කිරීම පිණිස සමස්ථ ගොවිජන සේවා මධ්‍යස්ථාන ජාලය මෙහෙයවීම සඳහා 2013 වර්ෂය තුළ මෙම අංශය වෙතින් ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළගස්වනු ලැබේ.

## 4.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණය.

- ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා ලැබීම.

  2013 වර්ෂය තුළ මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා 302ක් ඉදිරිපත් වී ඇත. මෙම පරීක්ෂණ වාර්තා මගින් අනාවරණය වී ඇති අඩුපාඩු යථාවත් කිරීම සඳහා දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, නියෝජ්‍ය /සහකාර කොමසාරිස් රැස්වීම්වලදී ද මධ්‍යස්ථාන වල අඩුපාඩු වාර්තා නොකිරීම සම්බන්ධයෙන් දැනුවත් කර ඇත.
- පහත සඳහන් පරිදි අවසන් ගිණුම් වාර්තා 478ක් 2013 වර්ෂය තුළ ලැබී ඇත.

| | | |
|---|---|---|
| 2012 වර්ෂයට අදාළව | - | අවසන් ගිණුම් වාර්තා 304 |
| 2011 වර්ෂයට අදාළව | - | අවසන් ගිණුම් වාර්තා 110 |
| 2011 ට පෙර වර්ෂවලට අදාළව | - | අවසන් ගිණුම් වාර්තා 64 |

## 4.2 අක්කර බදු අය කිරීම.

ගොවිජන සංවර්ධන අරමුදලට අක්කර බදු 20% දායක මුදල් වශයෙන් 2013 වර්ෂය තුළ ලැබී ඇති මුදල රු; 16,079,966.72 කි.

2013.03.18 - 03.24 දක්වා අක්කර බදු සතියක් පැවැත් වූ අතර, එහිදී එකතු වූ මුදල රු; 18,152,286.77 කි.

## 4.3 පොදු මුදල්/අක්කර බදු/ කුවිතාන්සි පොත් සහ මුදල් පොත් සැපයීම.

2013 වර්ෂය තුළ පහත සඳහන් පරිදි කුවිතාන්සි පොත් අලෙවියෙන් ලද රු.2,439,650.00 ක මුදලක් ගොවිජන සංවර්ධන අරමුදල වෙත බැර කර ඇත.

| කුවිතාන්සි පොත් වර්ගය | ප්‍රමාණය | මුදල (රු) |
|---|---|---|
| පොදු මුදල් කුවිතාන්සි පොත් | 29,195 | 1,459,750.00 |
| අක්කර බදු මුදල් කුවිතාන්සි පොත් | 17,154 | 857,700.00 |
| කම්ටු මුදල් පොත් | 94 | 122,200.00 |
| **එකතුව** | **46,443** | **2,439,650.00** |

## 4.4 කම්ටු සාමාජික දීමනා.

මේ සඳහා 2013 වර්ෂයේ රුපියල් මිලියන 4 ක මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, දිස්ත්‍රික්ක 25 සඳහා ඒ ඒ කාර්තුවලට අදාළව රු: 2,445,850/- ක මුදලක් වෙන් කර දී ඇත.

## 4.5 ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සේවා සැපයීම .

2013 වර්ෂය තුළ දී ද බීජ හා රෝපණ ද්‍රව්‍ය, පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි ජනතාව වෙත සපයා දී ආදායම් උපයා ඇත. (ඇමුණුම 3)

## 4.6 "කෙතට අරුණ" පොහොර සහනාධාර වැඩ සටහන.

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන සහනාධාර පොහොර වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී මෙම වර්ෂය තුළ 2012/2013 මහ කන්නය, 2013 යල කන්නය හා 2013/2014 මහ කන්නය යන කන්න තුනම අන්තර්ගත වේ. ඒ අනුව මෙම කන්න තුන තුළම පොහොර නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කන්නය | පොහොර ලබාගත් ගොවීන් ගණන | කුඹුරු අක්කර ප්‍රමාණය | නිකුත් කරන ලද ප්‍රමාණය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|---|---|
| | | | **UREA** | **TSP** | **MOP** | එකතුව |
| 2012/13 මහ | 1044343 | 1,727,207.22 | 153 ,105.72 | 50,512.96 | 43,459.14 | 247,077.82 |
| 2013 යල | 655297 | 1,111,510.77 | 74,671.99 | 18,303.53 | 20,272.92 | 113,248.44 |
| *2013/14 මහ | 677059 | 1,269,153.26 | 90,045.96 | 25,788.11 | 28,058.34 | 143,892.41 |

2013/2014 මහ කන්නය මේ වනවිටත් ක්‍රියාත්මක බැවින්, ලැබී ඇති වාර්තා අනුව මෙම තොරතුරු සකස් කර ඇත. අවසන් වාර්තා තවදුරටත් ලැබෙමින් පවතී.

## 4.7 2KR - ජපන් යෙන් ආධාර යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය

2013 වර්ෂය තුළ මෙම ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ අලුතින් ට්‍රැක්ටර් ලැබී නොමැති අතර, පසුගිය වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව මගින් බෙදාහරින ලද ට්‍රැක්ටර්/කෘෂි උපාංග වෙනුවෙන් 2013 වර්ෂය තුළ දී පහත දැක්වෙන පරිදි රු.70,989,675.90ක ණය වාරික මුදල් ප්‍රමාණයක් අය වී ඇත.

**රෝද 02 ට්‍රැක්ටර් වාරික මුදල්**

| | | |
|---|---|---|
| 1992-2001 වර්ෂ තුළ ගොවි සංවිධාන වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - | රු.510,443.00 |
| 2006 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - | රු.433,603.00 |
| 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - | රු.5,872,951.00 |
| 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - | රු.30,220,801.00 |
| 2012 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - | රු.32,121,912.00 |
| **එකතුව** | **-** | **රු.69,159,710.00** |

**රෝද 04 ට්‍රැක්ටර් වාරික මුදල්**

1989-2001 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබා දී ඇති ට්‍රැක්ටර් සඳහා

- රු. 933,678.90

**වතුර පොම්ප වාරික මුදල්**

2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කරන ලද වතුර පොම්ප සඳහා

- රු. 896,287.00

